රෝගී තත්ත්වයක් නිසා මියගිය බවට පැවසෙන කාන්තාවකගේ භූමිදානය කළ මෘතදේහය ගොඩට ගෙන තිබීමේ පුවතක් හිරු නිව්ස් (ජනවාරි 07, 2024) වාර්තා කර තිබුණේ මෙලෙසිනි. මේ සම්බන්ධයෙන්, මාධ්‍ය නිරීක්ෂණයේ යෙදුණු අපගේ පාඨකයෙකු විසින් Ethics Eye අවධානය යොමු කරවන්නට යෙදිණි.

* "සුරූපී තරුණියගේ මළ සිරුර ගොඩගත් අභිරහස", "සුරූපිනියගේ සිරුර ගොඩගත් අභිරහස", "ගොඩගත් සිරුර නිරුවත් කළේ ඇයිදැයි පොලිසියෙන් පරීක්ෂණ"

ඒ අනුව,

01) මෙම මිය ගිය තරුණියගේ සිරුර ගොඩ ගෙන තිබීමේ සිදුවීමට ඇගේ බාහිර රූපය කෙතරම් අදාළ ද?

02) මිය ගිය අයගේ බාහිර රූපය පුවත තුළ ඉස්මතු කොට දක්වන්නේ, මිය ගිය කාන්තාව ලිංගික වස්තුවක් ලෙසින් හැඟවුම් කරමින් පුවතට හැඟීම් කළඹවන සුළු (භාවාතිශය) බවක් ලබා දීමට ද? මෙය කෙතරම් මාධ්‍ය ආචාර ධාර්මික ද?

මීන් පෙර ද කොළඹ ජාතික රෝහලේ සේවය කළ හෙදියක් හදිසියේ මරුමුවට පත් වීමේ සිදුවීම හිරු නිව්ස්(දෙසැම්බර් 28, 2023)"හිටි හැටියේ මරු දුටු සුරූපී හෙදිය" ලෙසින් වාර්තා කර තිබූ බව අප පෙන්වා දුන්නෙමු.

එම පෝස්ටුවට සබැඳිය: https://web.facebook.com/ethicseye/posts/pfbid0TqrhKZGHHxKnVZ1THX29X8nxdET2sxSXfGRzsss7zyhh46aJqnFhf1rXf6e4GaXPl

